ශ්‍රී ලංකා ජීව විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලියට සහභාගි වී පදක්කම් දිනා ගැනීමට ශ්‍රී ලාංකික සිසුන්ට දැන් අවස්ථාව ලැබී ඇත. සිසුන් හතර දෙනෙකුට 2017 එංගලන්තයේ පැවැත්වෙන අන්තර්ජාතික ඔලිම්පියාඩ් තරඟාවලියට සහභාගි වීමට හැකි වේ.

**සුදුසුකම් :**
2016 හෝ 2017 උසස්පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට මෙයට අයදුම් කළ හැක. ශ්‍රී ලාංකික තරඟාවලියට වයස් සීමාවක් නැතත්, අන්තර්ජාතික තරගයට සහභාගි වීම සඳහා 2017 ජුනි 30 දිනට වයස අවුරුදු 20ට අඩු විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :**

- අයදුම්පත් ගාස්තුව රු. 800 වන අතර එය ළඟම ඇති මහජන බැංකු ශාඛාවට ගොස් මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ 086-1-001-4-1191763 ගිණුම් අංකය දරන ''ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය'' ගිණුමට බැර කරන්න. එම මුදල ආපසු ගෙවනු නොලැබේ.
- මේ සමඟ ඇති අයදුම්පත සම්පූර්ණ කර මහජන බැංකුවට මුදල් ගෙවූ මුදල් තැන්පතු පත සමඟ පහත ලිපිනයට **2016 මැයි 31 ට පෙර තැපැල් කරන්න.**
  ජීව විද්‍යා ඔලිම්පියාඩ් සමායෝජක,
  ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනය,
  ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගම් කාර්යාලය,
  120/10, විද්‍යා මාවත, කොළඹ 07
- අයදුම්පත් http://www.iobsl.org වෙබ් අඩවියෙන් ද බාගත හැකි අතර මේ සමඟ ඇති අයදුම්පත හෝ එහි ඡායා පිටපත් ද භාවිත කළ හැක.

**ශ්‍රී ලංකා ජීව විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලිය**

- ජයග්‍රාහකයින් තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන තරඟ විභාගය 2016 ජුනි 26 වන ඉරු දින පෙ.ව. 10.00 සිට 12.00 දක්වා පහත සඳහන් මධ්‍යස්ථානවලදී පැවැත්වේ.
  - කොළඹ විශ්වවිද්‍යාලය — කොළඹ 07
  - නැගෙනහිර විශ්වවිද්‍යාලය — මඩකලපුව
  - යාපනය විශ්වවිද්‍යාලය — යාපනය
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලය — පේරාදෙණිය
  - රුහුණු විශ්වවිද්‍යාලය — මාතර
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය — නුගේගොඩ
- බහුවරණ ප්‍රශ්න 40ක් හා කෙටි පිළිතුරු ප්‍රශ්න 20කින් සමන්විත පැය 2ක ප්‍රශ්න පත්‍රයක් තරඟකරුවන්ට ලැබෙනු ඇත.
- මේ තරඟ විභාගය අ.පො.ස. උ.පෙළ ජීව විද්‍යා පාඨමාලාව (ව්‍යවහාරික ජීව විද්‍යාව ඒකකය හැර) මත පදනම් වන අතර ජීව විද්‍යාවේ වර්තමාන ප්‍රවණතා හා ප්‍රායෝගික යොදාගැනීම් පිළිබඳවද ප්‍රශ්න අන්තර්ගත වේ.
- සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් තරඟ විභාගයට පෙනී සිටීමට තරඟකරුවන්ට අවස්ථාව තිබේ.
- තෝරාගත් තරඟකරුවන්ට ඇතුළත්වීමේ පත්‍රිකා 2016 ජුනි 20 දිනට පෙර ලැබෙන්නට සලස්වනු ඇත.

**ජයග්‍රාහකයන් තෝරා ගැනීම**

- තරඟකරුවන්ගේ හැකියාව ප්‍රදර්ශනය කිරීම මත, රන් රිදී හෝ ලෝකඩ පදක්කම් ප්‍රදානය කෙරෙනු ඇත.
- ජීව විද්‍යා ආයතනයේ විධායක පාලක සභාවේ තීරණය අවසාන තීරණය වේ.
- තරඟ විභාගයේ 50% වඩා වැඩි ලකුණු ලබාගන්නා තරඟකරුවන්හට කුසලතා සහතිකයක් පිරිනමනු ඇත. සියලුම ප්‍රතිඵල www.iobsl.org වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

**විස්තර සඳහා විමසන්න:**
ශ්‍රී ලංකා ජීව විද්‍යා ඔලිම්පියාඩ් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය, වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. පබසර (077-1006937) අරුන්දතී (077-9646659)